**සතර අභිනය**

“අභි”-යනු ඉදිරියටද,”නය “-දීම හෙවත් ගෙනයාමයි. අභිනය හා භාව ප්‍රකාශනය නාට්‍යයේ මෙන්ම නර්තනයේ ජීවය ලෙස දැක්විය හැකිය.මෙය සංස්කෘත භාෂාවේ එන වචනයකි. භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි අභිනය යන්න නිර්වචනය වන්නේ ඉදිරියට ගෙන ඒම යන අර්ථයයි.

***නන්දිකේශ්වරයන් විසින් අභිනය දර්පණය*** නම් ග්‍රන්ථයේ ශිව නමස්කාරය දක්වා ඇත.

“ආංගිකම් භුවනම් යස්‍ය
වාචිකම් සර්ව වාග්මයම්
ආහාර්යම් චන්ද්‍රතාරාදි
තංනුම:සාත්ත්විකම් ශිවම්”

ලෝකයේ සියලුම චලන ශිව දෙවියන්ගේ චලන භාෂාව වචන ලෙසත් සද හා තරු වස්ත්‍ර හා ආභරණ ලෙසත් දුක්ඛ හා දෝමනස්ස ශිව දෙවියන්ගේ හැඟීම් බවත් මෙයින් කියවේ.

පහත දැක්වෙන චතුර්විධ අභිනයන් ප්‍රේක්ෂකයින් හට කිසියම් අදහසක් ලබා දීම සඳහා රංගන අවස්ථා තීව්‍ර කිරීම සඳහා භාවිතා කර ඇත.

1. ආංගික අභිනය
2. වාචික අභිනය
3. සාත්වික අභිනය
4. ආහාර්ය අභිනය කිසියම් භාෂාවක් මුල්කොට ගෙන අදහසක් දැක්වීමේදී එම භාෂාව නොදත් ජන සමූහයකට වුවද ඉදිරිපත් කරනු ලබන සරල අංග චලන මගින් තේරුම් ගැනීමට හැකියාව ඇත. කවර හෝ නාට්‍යක නර්තනයක නිර්මාණයක ප්‍රේක්ෂකයාට තෘප්තියක් වින්දනයක් ඇතිවන ආකාරයට අංගචලනයන් හැසිරවීම තුලින් සිදු කරන අර්ථප්‍රකාශනය ආංගික අභිනයයි.

**වාචික අභිනය -**

වාචික අභිනය යනු වචන නැතහොත් කිසියම් ව්‍යවහාර භාෂාවක් යොදා ගනිමින් අදහස් ප්‍රකාශ කිරීමයි. සාමාන්‍ය ජීවිතයේදී අප තුල ඇති අදහස් අන් අයට සන්නිවේදනය කිරීමට වචනය ප්‍රබල මාධ්‍යයක් ලෙස සැලකේ.

වචනය භාවිතය තුල යම් අර්ථයක් ප්‍රකාශ වෙයි. එමෙන්ම එහි භාවමය ස්වරූපයක් ද ඇත. ඒ තුල කරුණාව තරහ, බිය,පිළිකුල, ආදරය,හාස්‍ය වැනි හැගීම් දක්නට ලැබිය හැක. වචනයෙන් ප්‍රකාශවන අරුත සේම එම ප්‍රකාශයේ මුදු බව, දැඩි බව ,රළු බව, රාගික බව වැනි භාවමය ලක්ෂණ දැකිය හැක.

එමෙන්ම කිසියම් නළුවෙකු නාට්‍යකදී වාචික අභිනයෙන් අදහස් ප්‍රකාශ කරන ආකාරය අප දැක ඇති අතර සිංහබාහු, මනමේ වැනි නාට්‍ය වල සංවාද ගීතමය ලක්ෂණ වලින් යුක්තය.

ශාන්ති කර්ම වලදී නාට්‍යමය අවස්ථා වලදී අවස්ථා නිරූපනය සඳහා බහුලව වාචික අභිනය භාවිතා කෙරේ. නාට්‍යක හෝ කිසියම් නිර්මාණයකදී එහි චරිත නිරූපනයේදී නළු නිළියන් සංවාදයෙන්, ගීතයෙන් අදහසක් ප්‍රේක්ෂකයාට සන්නිවේදනය කරයි නම් එය වාචික අභිනයයි.

**ආංගික අභිනය**



නාට්‍යක චරිත නළු නිලියන් මගින් ප්‍රේක්ෂකයා ඉදිරියේ ජීවමාන කිරීමේදී ඒ ඒ චරිත අත් පා හා සෙසු ශරීර අංග උපයෝගී කර ගනිමින් ඉරියව් පෑම ආංගික අභිනයයි. උදා - අත් පා,ගමන් විලාස, සිටීම, හිදීම, එන්න,බයන්න වැනි මිනිසාගේ සාමාන්‍ය ඉරියව් නිරූපනය කිරීම.

**අංග ,ප්‍රත්‍යංග ,උපාංග** වශයෙන් ආංගික අභිනය කොටස් කෙරේ.

අංග- හිස, කද, දෑත් ,දෙපා

ප්‍රත්‍යංග - බෙල්ල, උරබාහු, වැළමිටි, මැණික් කටුව

උපාංග - ඇගිලි, ඇස, ඇහි බැම, තොල්

භරත නාට්‍යම්හි එන මුද්‍රා භාවිතයද ආංගික අභිනයට අයත් වේ. එමෙන්ම අර්ථයක් ප්‍රකාශ නොවුවද කිසියම් රසයක් ලබාදෙන චලනයක් ආංගික අභිනයෙහි ලා සැලකිය හැක.මෙහිදී දේශීය නර්තනය ආංගික අභිනයෙන් පොහොසත් අතර අර්ථය ප්‍රකාශ නොවුවද එයින් ලැබෙන සුන්දරත්වය මගින් රසයක් විදීමට අවශ්‍ය භාවය ලබා දේ.

**සාත්වික අභිනය**

 

ශරීරයේ උපාංග ලෙස දැක්වූ ඇහි බැමි, ඇහේ බෝලය, කම්මුල් ,නාසය වැනි සියුම් අවයව භාවිතයෙන් අදහස් ප්‍රකාශනය සාත්වික අභිනයයි. භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව කිසියම් භාවයක් ප්‍රකාශවීමේදී කඳුළු සැලීම,දහඩිය දැමීම, ශරීරය ලොමුඩැහැ ගැන්වීම ,වෙවුලීම,ක්ලාන්තය වැනි සියළුම ක්‍රියාවලි සාත්වික අභිනයට සාත්වික අභිනයට අයත් වේ. එමෙන්ම සාත්වික අභිනය දක්වන උපාංග මත පමණක් නොව අංග,ප්‍රත්‍යංග, උපාංග යන ත්‍රිත්වය සුසංයෝගී වීමෙන් ප්‍රදර්ශනය වේ.නර්තනය බැදි ඇතැම් අවස්ථාවලදී මෙවැනි තත්වයන් ප්‍රදර්ශනය වේ.

උදා - පහතරට නර්තන සම්ප්‍රදාය  -සන්නි,පාලි

**ආහාර්ය අභිනය**







ආහාර්ය අභිනය නර්තනයේ විචිත්‍රත්වයට ආභරණයකි. රංග වස්ත්‍රාභරණ වේෂ නිරූපන,වේදිකා උපකරණ ආලෝකය ,වේදිකා සැරසිලි, පසුතල නිර්මාණ ඊට අයත්ය. ආංගික, වාචික, සාත්වික, අභිනය මගින් දක්වන හැගීම් ආහාර්ය අභිනය මගින් තීව්‍ර කරයි.

මෙහි අංගෝපාංගයන්ගෙන් අදහසක් ප්‍රකාශ වීම පිළිබද සැළකිලිමත් වීමේදී,

වඩිග පටුන නර්තනයේදී බමුණු පඩිවරයකුගේ චරිතය

- සන්නි යකුමේ එන කණ සන්නිය නැටිමේදී හැරමිටිය හසුරුවන ආකාරයෙන් අන්ධ පුද්ගලයකු බව
- කරදිය මුදා නාට්‍යයේ දක්නට ලැබෙන පැල්පත,වැටකේ පදුර,ගල්කුල, පොල් ගස්,පසුතලය මත ගොඩනගන නිල් වර්ණය, මුහුදු බඩ පරිසරයේ ස්වරූපය පසුතලයෙන් මැවේ.
- විදේශීය නර්තන සම්ප්‍රදායන්හි එන කථකලි නර්තන සම්ප්‍රදායේ ආහාර්ය අභිනයට ප්‍රධාන තැනක් ලබා දේ.රංග වස්ත්‍රාභරණ හා වේෂ නිරූපන සංකීර්ණවේ.

කාර්ය පත්‍රිකාව -

- 1. සතර අභිනය නම් කරන්න.
- 2. සතර අභිනය විස්තර කරන්න.
- 3. නර්තන නිර්මාණයෙහි සාර්ථකත්වයෙහි ලා සතර අභිනය ඉවහල්වන අයුරු විස්තර කරන්න.